

# සොබාදහමේ අපූරු තැග්ග

අදිති බිනුල්‍යා වික්‍රමසිංහ

# සොබාදහමේ අපූරු තෑග්ග

## අදිති බිනුල්යා වික්‍රමසිංහ

**(කතෘ)**

**5 ශ්‍රේණිය D**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

**2026.05. 10**

**කතෘගෙ වෙනත් කෘති**

- ආඩම්බර කුරුලු පැංචි
- අපේ සතුටු දවස

# පිදුම

"සොබාදහමේ අපූරු තෑග්ග" යන මාගේ මෙම කෘතියෙන් සොබාදහමේ විශ්මිත නිමැවුම් රැක ගැනීමේ වැදගත්කම පිළිබඳ අපූරු කතාවක් අපිට කියාදෙයි. නදුනි, යෙහෙළිය මෙන් මා ද සොබාදහමට සතුන්ට බොහෝ සේ ආදරය දක්වමි. එවැනි යහපත් සිතක් මා තුළ ඇති කිරීමට වෙහෙස මහන්සි වූ මාගේ දෙමාපියන්ටත්, ඉගැන්වීමෙන් මෙන්ම ක්‍රියාවෙන් අප සිත් සොබාදහම රැක ගැනීම කෙරෙහි යොමු කළ මා ආදරණීය පාසල් මාතාව වෙතත් මාගේ මෙම කෘතිය පුද කරමි.

# ස්තූතිය!

මාගේ සියලු කටයුතුවල දී මෙන්ම මෙම පොත ලිවීමේදී මා හට උපරිම සහයෝගය ලබා දුන් මාගේ මෑණියන්ටත් මගේ පියාණන්ටත්, මෙම කටයුතු සඳහා අප උනන්දු කරවමින් වැරදි නිවැරදි කිරීම් කරදෙමින් නිරන්තරයෙන් ම අප යහපත වෙනුවෙන් වෙහෙස මහන්සි වී කටයුතු කරන අප පන්තිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමෑණියන්ටත්, අප පාසලේ විදුහල්පති මෑණියන්ටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැක. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිද කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුහවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලාව උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණය ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත

සම්මානනීය මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට ම කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026 -05-10


# සොබාදහමේ අපූරු තෑග්ග

නදුනි හැමදාම පාසල් යන්නේ ගස්වැල් වලින් පිරුණු, කුඩා කැලෑවකට මායිම්ව තිබුණු ලස්සන පාරක ය. නදුනි මෙන් ම අනික් ළමයි ද මෙම කැලෑවට මායිම්ව තිබූ පාර දිගේ පාසලට යන්න බොහෝ ආශා කළෝ ය. ඒ, එම පාර දෙපස ම තිබූ ගස් වැල් විවිධ වූ පලතුරු වලින් යුක්ත වී තිබූ බැවිනි.

අඹ, හිඹුටු, මා දං, කජු, ගඩු ගුඩා වැනි පලතුරු වලින්, එම මාර්ගය දෙපස තිබූ ගස් පිරී තිබුණි. එමෙන්ම එහි තිබූ ඇතැම් ගස්වැල් මලින් බර වී තිබීම නිසා එම ප්‍රදේශය පසු කරගෙන යන නදුනීට ඇය මල් වත්තක ඇවිදිනවා වැනි හැඟීමක් දැනුණි.



නදුනි ගස්වැල්වලට, මල්වලට හා සතුන්ට ගොඩක් ආදරෙයි. මේ සොබාදහම, පරිසරයේ අලංකාරය, සතුන් දැකීමට ගොඩක් ප්‍රිය කරයි.



එක දවසක් නදුනී පාසල් ඇරී ගෙදර යන විට කාගේදෝ අඬන ශබ්දයක් ඇසුණා. නදුනී ඒ දිශාවට දුවගෙන ගියා. එයා දැක්කා දොඩම් ගසකුයි ජම්බු ගසකුයි අඬ අඬා ඉන්නවා.

“ගස් අඬනවා! අනේ, ඇයි ඔයාලා අඬන්නෙ?” නදුනි ඇසුවා.

“අනේ බලන්නකො පුංචි ළමයෝ, අද උදේ මිනිස්සු වගයක් ඇවිල්ලා අපේ පුංචි අඹ ගස් යාළුවාව කපලා අරගෙන ගියානෙ” කියලා ජම්බු ගස කිව්වා.

"ඇයි එයාලා එහෙම නරක වැඩක් කළේ?" නදුනී ඇසුවා.

"ලී වලටයි, දර වලට විකුණන්න. එයාලා කතා වෙනවා මට ඇහුණා." දොඩම් ගස කිව්වා.

"අනේ, එතකොට අර අඹ ගහ පව්නෙ." නදුනි කිව්වා.

"ඔව්, අඹ ගස් යාළුවාත් ගොඩක් ඇඩුවා. අපටත් හරිම දුකයි." ජම්බු ගස කිව්වා.

"අපේ අඹ ගස් යාළුවා ගැන විතරක් නෙමෙයි පුංචි ළමයා දුක් වෙන්න ඕනේ" ජම්බු ගස් යාළුවා කිව්වා.

"එහෙනම්." නදුනි ඇසුවා.

"අපි හැමෝම ගැන." දොඩම් ගස් යාළුවා කිව්වා.

"ඒ කිව්වේ? මට තේරුනේ නෑ." නදුනී පිළිතුරු දුන්නා.

ඔන්න එතකොට ඔය කතාව අහගෙන හිටපු රඹුටන් ගස මෙහෙම කිව්වා.

"දැන් ඒ මිනිස්සු අඹ ගස් යාළුවාව කපලා අරගෙන ගියානේ, ඒ වගේ දවසින් දවස අපේ අනිත් ගස් යහළුවන්වත් කපලා දාවි. ඊට පස්සේ ඉතින් මේ සරුසාර භූමිය නිසරු මුඩු බිමක් බවට පත් වෙලා ඊට පස්සේ කාන්තාරයක් බවට පත්වෙයි. එතකොට තමයි අපි හැමෝ පව්. ලොකුම කණගාටුව තමයි, වැඩිහිටි මිනිස්සු දැන් මේ කරන පරිසර විනාශයෙන්, අනාගතයේදී වැඩිපුරම දුක්

විදින්න වෙන්නේ පුංචි ඔයාලට වෙන එක." රඹුටන් ගස කිව්වා.

"අනේ! ඒක කොහොමද වෙන්නේ? මට කියලා දෙන්නකෝ."නඳුනි පැවසුවා.



"මෙහෙමනේ පුංචි ළමයෝ. අපි හැමෝම මෙහෙම ලස්සනට ජීවත් වෙන්නේ අපේ සොබාදහම් මාතාව නිසයි. මේ ගහ කොළ, සත්තු, ගංගා, දිය ඇලි වගේම මිනිස්සු වෙච්ච ඔයාලත් මේ සොබාදහමට අයිති කොටස්. ඒ කියන්නේ, අපේ පරිසරය, මේ සොබාදහම හොඳින් තියෙන්න නම් අපි හැමෝම එකට ඉන්න ඕනේ."

ඔන්න ඉතින් කැලෑවේ ටිකක් ඇතුළට වෙන්න හැංගිලා හිටපු, අනෙක් අයට වඩා ටිකක් දැනුම් තේරුම් තියෙන කොස් ගස් මාමත් මේ කතාවට එකතු වුණා.

"කොස් ගස් මාමේ ඔයා කොහෙද හිටියේ? බලන්න කෝ, අපේ අඹ ගස් යාළුවට වෙච්ච දේ." දොඩම් ගසයි පේර ගසයි ආයෙත් අඬන්න පටන් ගත්තා.



"දරුවනි, අඬන්නෙ නැතුව කියන්න කෝ අපේ අඹ ගස් පැංචට මොකද වුණේ කියලා" කොස් ගස් මාමා ඇහුවා.

"අපේ අඹ ගස් යාළුවාව අර නරක මිනිස්සු කපලා අරගෙන ගියානේ" දොඩම් ගස කිව්වා. "එහෙම තමයි ළමයිනේ නරක මිනිස්සුන්ට අහුවුනොත්, නරකක් තමයි සිද්ධ

වෙන්නේ. මම කැලෑවේ ඇතුලටම වෙන්නේ හැංගිලා ඉන්න නිසා බේරිලා ඉන්නවා මිසක් මාව දැක්කොත් අනිවාර්යයෙන්ම කපලා දාවි. කොස් ගස් මාමා කිව්වා.

"එහෙම කරන එක පවු සිද්ධ වෙන වැඩක් නේ. ගස් වැල් වෙන ඔයාලා තමයි අපිට නැවුම් වාතය, ආහාර ලබාදෙන්නේ. සෙවන ලබා දෙන්නේ. පරිසරය සිසිල් කරන්නේ. පරිසරය ලස්සන කරන්නේ. අපි ගස් වැල්, මේ සොබාදහම ආරක්ෂා කර ගන්න ඕනි. ඉස්කෝලෙදි ගුරුතුමී අපිට කියලා දුන්නා, මේ ගස් වැල් මේ සොබාදහම අපට ලැබුණු වටිනා සම්පතක් කියලා. අපි මේ සම්පත ආරක්ෂා කරගන්න ඕනේ කියලා." නඳුනී කිව්වා.


"ඒකනේ, පුංචි ඔයාලට පුංචි කාලෙදිම ඉස්කෝලෙදිත් ඒ දේවල් කියලා දීලා තියෙන්නේ අපිට මේ පරිසරය ගොඩක් වැදගත් වෙන නිසා. හැබැයි ඉතින් මේ මිනිස්සුන්ට තාම ඒක තේරිලා නෑ." කොස් ගස් මාමා කිව්වා.

"අනේ කොස් ගස් මාමේ, මාමා දන්න දේවල් මට කියලා දෙන්නකෝ." නඳුනී කිව්වා.

"හොඳයි පුංචි ගෑණු ළමයො, එන්නකෝ... මම ඔයාට කියලා දෙන්නම්." කොස් ගස් මාමා කිව්වා.

කොස් ගස් මාමා පුංචි නඳුනිව එයාගේ අත්තක් උඩින් තියා ගත්තා. ඊට පස්සේ අනික් ගස් යාළුවොත් එක්ක කොස් ගස් මාමා ඉන්න කැලෑව ඇතුල් පැත්තට එක්කගෙන ගියා.

ඒක පුංචි කැලෑවක් උනාට කැලෑව ඇතුළට වෙන්න විශාල ගස් රාශියක් හොඳින් වැඩී තිබුණා. ටිකක් අන්ධකාරයි හැබැයි හරිම දැකුම්කලුයි. විවිධ හැඩයේ, විවිධ වර්ණයෙන් යුක්ත කැලෑ මල් පිපිලා, හරිම ලස්සනට මාත් එක්ක හිනා වුණා.



විවිධ පලතුරු ජාතිත් ගොඩක් තිබුණා. මම ඒ පලතුරුවල රසත් බැලුවා. ම්....... හරිම රසයි.


"කොස් ගස් මාමේ, මේ පලතුරු හරිම රසයි." හරි ආසාවෙන් පලතුරුවල රස බලන ගමන් නඳුනී කිව්වා.

"ඔව් පුංචි ගෑණු ළමයෝ. ඔයා හිතන්න කෝ මේ වගේ රස පලතුරු ජාති තියෙන විවිධ මල් ජාති පිරිලා තියෙන ගස්, මිනිස්සු කපලා දැම්මොත් කොයි තරම් ලොකු අපරාධයක් ද?"

"ගොඩක් ලොකු අපරාදයක්." නදුනි එහෙම කියනවාත් සමඟ ම කොස් ගස් මාමා එයාව බිමින් තිබ්බා.

එතන පුංචි දිය පාරක් ගලාගෙන යනවා නදුනී දැක්කා.

"අනේ..... මෙතන හරි ම ලස්සනයි. පුංචි දිය පාරකුත් ගලාගෙන යනවා. හරිම පිරිසිදු වතුර. මේ වතුර බොන්නත් පුළුවන්ද කොස් ගස් මාමෙ?" නදුනී ආසාවෙන් ඇහුවා.



"ඔව්, පුළුවන්. මෙ වතුර හරිම පිරිසිදුයි. කොස් ගස් මාමා කිව්වා.

“මේ වතුර ගලාගෙන එන්නේ කොහෙන්ද කොස් ගස් මාමේ?” නදුනි ඇසුවා.

“අපේ මේ කැලෑව මැද්දේ තියෙන උල්පත් වලින් ගලාගෙන එන ජලය තමයි මේ. මේ වගේ උල්පත් රාශියක් මේ කැලෑව ඇතුලෙ තියෙනවා.” කොස් ගස් මාමා පිළිතුරු දුන්නා.

“එතකොට, මේ වතුර කොහෙටද මේ යන්නේ කොස් ගස් මාමේ?” නදුනි ඇසුවා.

“ඔයා දැකල තියෙනව ද ගමේ කෙළවරින් ගලාගෙන යන පුංචි ගංඟාව?” කොස් ගස් මාමා ඇහුවා.

“ඔව්, මම දන්නවා. අපේ ගමේ කුඹුරු වලට, එළවළු කොරටු වලට වතුර ගන්නේ ඒ ගඟෙන් තමයි.” නදුනී කිව්වා.

“ඔයා දන්නව ද ඒ ගඟට වතුර ලැබෙන්නේ කොහොමද කියලා?” කොස් ගස් මාමා ඇහුවා.

“ම් ම් ම්..... ඒක නම් මම දන්නේ නෑ.” නදුනී කිව්වා.

“මෙන්න මේ පුංචි දිය උල්පත්වලින් ගලාගෙන යන වතුර එකතු වෙලා තමයි ඒ ගංඟාව හැදිලා තියෙන්නේ.” කොස් ගස් මාමා කිව්වා.

“මම ඒ ගැන දැනගෙන හිටියේ නැහැනේ.”

“එතකොට මේ පොළොව ඇතුලේ මෙහෙම වතුර තියෙන්නේ කොහොමද කොස් ගස් මාමේ?” නඳුනි පුදුමයෙනුත් කුතුහලයෙනුත් ඇසුවා.

අනෙක් ගස් යාළුවොත් හරිම කුතුහලයෙන් තමයි කොස් ගස් මාමාගෙන් උත්තරයක් ලැබෙනකල් බලාගෙන හිටියේ.

“අපේ මේ පොළොවේ තියෙන ජලය ආරක්ෂා වෙලා තියෙන්නේ ගස් වැල් නිසා තමයි.” කොස් ගස් මාමා කිව්වා.

“ඒ කිව්වේ? මට තේරුනේ නෑ.” නඳුනි කිව්වා.

“ඒ කියන්නේ, අපේ මේ කැලෑව ඇතුලේ තියෙන ගස් හොඳින් උසට වැඩිලා අතු විහිදිලා තියෙනවා ඔයාලට පේනවා නේද? ඒ වගේම විශාල වැල් ඒ ගස් අතු අතර එති එතී හැම තැනම පැතිරිලා තියෙනවා. හරියට උඩුවියනක් බැඳලා වගේ. ඒ විදිහට ගස්වල සෙවන ලැබෙන නිසා, ඉර රස්නෙ කෙලින්ම මේ පොළොවට වැටෙන්නේ නැහැ. ඒ නිසා පොළොව වේළෙන්නෙ නැතුව පොළොවේ තෙතමනය හොඳින් ආරක්ෂා වෙනවා. ඒ වගේම මේ ගස් වල තියෙන මුල් නිසාත් මේ පොළොවේ ජලය හොඳින් ආරක්ෂා වෙනවා. ඒ විදිහට පොළොව ඇතුළෙ ආරක්ෂා වෙලා තියෙන ජලය සමහර තැන් වලින් පොළොව මතුපිටට ගලාගෙන එනවා. අපි ඒවට උල්පත් කියලා කියනවා. දැන් තේරුණාද? කොස් ගස් මාමා විස්තර කළා.

“ඔව්, මට දැන් තේරෙනවා. අපිට බොන්න තියෙන මේ ජලය ආරක්ෂා කරල දෙන්නෙත්, මේ ගස්වැල්ම තමයි.” නඳුනී කිව්වා.

“ඒ ගැන නම් අපි දැනගෙන හිටියේත් නැහැනෙ කොස් ගස් මාමේ. දැන් තමයි තේරුණේ.” පුදුමයෙන් වගේ කතාව අහගෙන හිටපු ගස් යාළුවොත් කිව්වා.

“අපිට වැස්සෙනුත් වතුර ලැබෙනවා නේද? නඳුනී ඇසුවා.

“ඔව් අපිට වැස්සෙනුත් වතුර ලැබෙනවා. ඉර රස්නෙ නිසා මුහුදෙන්, ජලාශවලින් වාෂ්ප වෙලා ඉහල නගින ජල වාෂ්ප අහස උඩදී සීතල නිසා ඝණවෙලා වලාකුළු හැදෙනවා. ඊට පස්සේ වලාකුළු බර වෙලා ඒ දිය බින්දු වැස්ස විදිහට ආපහු පොළොවට කඩාගෙන හැලෙනවා ඒක මේ සොබාදහමේ සිද්ධවෙන හරි අපූරු සිදුවීමක්.” කොස්ගස් මාමා කිව්වා.

“ඔව් ඒ ගැන අපට ඉස්කෝලෙදිත් කියලා දුන්නා”. නඳුනි කිව්වා.

“හැබැයි හැම කාලෙදිම අපිට වැස්ස ලැබෙන්නෙ නෑ. නේද?” කොස්ගස් මාමා ඇහුවා.

“වැස්ස ලැබෙන්නේ කාලෙන් කාලෙට සමහර කාල වලදී අපිට වැස්ස ලැබෙන්නේ නෑ. වියළි කාලගුණික තත්ත්වයකදී ඉර හොඳින් පායනවා. ඒ නිසා ඒ කාලයට අපි

අපේ පොළොවේ තියෙන ජලය ආරක්ෂා කර ගැනීම හරි ම වැදගත්. අන්න ඒ වැදගත් රාජකාරිය ඉටු කරන්නේ අපේ මේ ගස්වැල් තමයි.” කොස්ගස් මාමා කිව්වා.



“ඔව් මට තේරුණා මාමේ. මේ ගස්වැල් වලින් ලැබෙන සෙවණ නිසා වියළි කාලයේදී තද ඉර රශ්මියෙන් අපේ මේ පොළොවේ තියෙන ජලසම්පත ආරක්‍ෂා වෙනවා.” නඳුනී කිව්වා.

“අන්න හරි. අපිට මේ ගස් වැල් නොතිබෙන්න මේ භූමියෙ ජලය සම්පත ආරක්ෂා කරගන්න බැරි වෙනවා. එහෙම වුණොත්, මේ ගහ කොළ විතරක් නෙමෙයි ජලය නැතුව මිනිස්සු, සත්තු මේ අපි හැමෝම, මුළු පරිසරයම විනාශ

වෙලා යනවා. කාලයත් එක්ක මේ භූමියත් කාන්තාරයක් බවට පත්වෙනවා.'' කොස් ගස් මාමා කිව්වා.

''අම්මෝ..... ඒ ගැන අහද්දිත් අපිට බය හිතෙනවා.'' නඳුනී මෙන්ම අනිත් ගස් යාළුවෝත් කිව්වා.

''මේ භූමිය ආරක්ෂා කර ගන්න අපි මොනවද කරන්න ඕනේ කොස් ගස් මාමේ?'' කොස් ගස් මාමා කියපු දේවල් අහලා, බයවෙලා හිටපු ගස් යාළුවෝයි නඳුනියි ඇසුවා.

''බයවෙන්න එපා දරුවනේ. මේ දේවල් අපිට ආරක්ෂා කර ගන්න පුළුවන්. අපිම තමයි මේවා ආරක්ෂා කර ගන්නත් ඕන. මේ සොබාදහම ආරක්ෂා කර ගැනීමේ ලොකුම වගකීම තියෙන්නේ මිනිස්සු වෙන ඔයාලට. මොකද? සොබාදහම එයාලම විනාශ වෙන්නේ නැහැ. මේ පරිසරයට හානි වෙන වැඩ කරන්නේ මේ පරිසරය ආරක්ෂා කරන්න ඕන මිනිස්සු ම තමයි. මිනිස්සු වෙච්ච ඔයාලගේ ජීවන රටාව ඔයාලා යහපත් විදිහට හැඩගස්ව ගත්ත නම් මේ ප්‍රශ්න ගොඩකට අපිට විසඳුම් හොයා ගන්න පුළුවන්.''

''සොබා දහමෙන් අපට ලැබිලා තියෙන මේ ස්වාභාවික සම්පත් නාස්ති නො කර අර පරිස්සමෙන් පාවිච්චි කරන්න, විශේෂයෙන්ම අපේ මේ ජල සම්පත අර පරිස්සමෙන් පාවිච්චි කරන්න අපි පුරුදු වෙන්න ඕනේ. ඒ වගේම කැලි කසළ පරිසරයට බැහැර කිරීමේ දී පරිසරයට හානියක්

නොවන විදිහට ක්‍රමවත්ව සිද්ධ කරන්නත් අපි පුරුදු වෙන්න ඕනේ. අපි මේ පරිසරයේ ස්වභාදහමේ දේවල් ප්‍රයෝජනයට අරගෙන පහසුවෙන් ජීවත් වෙනවා වගේම අනාගත පරම්පරාවටත් මේ පරිසරය, මේ සොබාදහම ආරක්ෂා කරලා දෙන්නත් අපි වගබලා ගන්න ඕනේ.''

'' ඒ කියන්නේ?'' නඳුනී ඇසුවා.

''ඒ කියන්නේ, අපි ගහක් කපනවා නම් අපේ අවශ්‍යතාවකට, ඒ වෙනුවෙන් ගහක් හෝ දෙකක් හිටවන්න මතක තියාගන්න ඕනේ. මේ වගේ පුංචි පුංචි යහපත් පුරුදු ටිකක් අපේ ජීවන රටාවට අපි එකතු කරගත්තොත්, හැමදාම අපිට මේ සොබාදහම මේ විදිහටම ආරක්ෂා කර ගන්න පුළුවන්. ඔයාලට තේරුණා ද?'' කොස් මාමා ඇහුවා කොස් මා මගේ කතාව අහගෙන හිටපු හැමෝගෙම හිතට හරිම සහනයක් දැනුණා.

''මට තේරුණා කොස් ගස් මාමේ. මගේ මේ ගස් යාළුවෝ නිසා, මේ සොබාදහම නිසා තමයි අපේ ජීවිත ආරක්ෂා වෙලා තියෙන්නේ. ඒක නිසා අපිත් පුරුදු වෙන්න ඕනේ මේ සොබාදහම හොඳින් ආරක්ෂා කර ගන්න. ඒකට අපිට කරන්න පුළුවන් හැමදේම අපි කරන්න ඕනේ. මට ඒ ගැන හොඳටම තේරුණා.'' දිග හුස්මක් අරගෙන නඳුනී කිව්වා.

"අන්න හරි. දැන් නම් මේ පුංචි ගෑණු ළමයට ඒ ගැන හොඳට ම තේරිලා තියෙනවා. මට හරිම සතුටුයි."

"තව දෙයක් කියන්න ඕනේ. ඔයා හරිම හොඳ පුංචි දරුවෙක්. ඔයා ගොඩක් පරිසරයට ආදරේ කරනවා. ඒ නිසාමයි මම ඔයාට මේ දේවල් ගැන කියලා දුන්නේ. ඔයා වගේම මේ සොබාදහමට ආදරේ කරන පුංචි දරුවෝ ගොඩාක් ඉන්නවා. ඔයාලා හැමෝම එකතුවෙලා අපේ මේ සොබාදහම ආරක්ෂා කරගෙන අනාගතයට ගෙනියන්න ඕනේ. ඒක තමයි මගේ ප්‍රාර්ථනාව." කොස් ගස් මාමා කිව්වා.

"බොහොම ස්තුතියි කොස් ගස් මාමේ. මේ පරිසර, මේ කුරුල්ලෝ, සත්තු, මගේ මේ ගස් යාළුවො මේ හැමෝටම මම ගොඩක් ආදරෙයි. මේ ගස් වැල් සොබාදහමෙන් අපට ලැබුණු අපූරු තෑග්ගක්. සොබාදහම ආරක්ෂා කරන්න මම පොරොන්දු වෙනවා. ඒ වගේම මම මගේ යාලුවෝ හැමෝටම මේ දේවල් ගැන කියනවා. කොස් ගස් මාමාට බොහොම ස්තූතියි, මට මේ දේවල් කියලා දුන්නට." නඳුනි කිව්වා.

"දැන් නම් හවස් වෙන්නත් කිට්ටුයි. අම්මත් මඟ බලාගෙන ඇති නේද? " කොස් ගස් මාමා ඇහුවා.

"ඔව්, මට ඒකත් අමතක වුණා. දැන් මං කොහොමද ගෙදර යන්නේ?" ඒ සුන්දර කැලෑරොද තුළ කාලය ගෙවුණා නඳුනීට දැනුනේ ම නෑ.



"බයවෙන්න එපා. අපි ඔයාව එක්කගෙන යන්නම්. අපි දැන් හොඳ යාලුවනේ." දොඩම් ගසයි පේර ගසයි රඹුටන් ගසයි එකවර කිව්වා.

"ඔව්, අපි දැන් හොඳම යාළුවෝ." නඳුනී කිව්වා.

"අපි ගිහින් එන්නම් කොස් ගස් මාමේ. ඔයාට ගොඩාක් ස්තුතියි!." නඳුනි කිව්වා.

“හොඳයි දරුවනේ, පරිස්සමෙන් ගිහින් එන්න.” හැමෝම කොස් ගස් මාමාගෙන් සමු ගෙන කැලෑවට මායිම්ව තිබූ පාර දෙසට එන්නට පිටත් වුණා. ගස් යාළුවෝ හරිම පරිස්සමෙන් නදුනීව පාර දෙසට රැගෙන ආවා.

නදුනී ගස් යාළුවන්ගෙන් සමුගෙන ඉතා ඉක්මනින් නිවස දෙසට එන්නට පිටත් වුණා.

නිමි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පරීක්ෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පරීක්ෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි නිසාය.

අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනවිරත්න මහ ලේකම්

ව්‍යාපෘති නිර්මාතෘ

**ISBN 978-624-211-130-8**